THE NATIONAL PHOTOGRAPHIC ART SOCIETY OF SRI LANKA

නිදහසට පෙර ශ්‍රී ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම පාහේ විදේශ ආධිපත්‍යය බල පැවැත් වුනි. නිදහසින් පසුව ද බොහෝ ක්ෂේත්‍ර ශ්‍රී ලාංකිකයන්ට විවෘත නොවිණි. එවන් ක්ෂේත්‍රයක් වූ 'ඡායාරූප ශිල්පය' ලාංකික පොදු ජනතාව අතරට රැගෙන යාමේ පරමාර්ථයෙන්, **1950 මාර්තු මස 15** වන දින ප්‍රවීණ ඡායාරූප ශිල්පී විල්සන් හෑගොඩ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් **ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය** පිහිටුවිය. ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය නමින් ආරම්භ කරන ලද, **ද නැෂනල් ෆොටෝග්‍රැෆික් ආර්ට් සොසයිටි ඔෆ් ශ්‍රී ලංකා** ආයතනය දේශීයව සහ ජාත්‍යන්තරව ඡායාරූප ශිල්පයට කරන ලද සේවය වෙනුවෙන් ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ **Fédération Internationale de l'Art Photographique"** ***(Eng. International Federation of Photographic Art - FIAP)*** ශ්‍රී ලංකාවේ මෙහෙයුම් නියෝජිත ලෙස පත්කර ඇත. ඇමරිකානු ඡායාරූප සංගමයේ ***(Photographic Society of America - PSA)*** ද සාමාජිකත්වය ලබාගෙන ඇත. තවද ගෝලීය ඡායාරූප සංගමය ***(Global Photographic Union)*** හි ශ්‍රී ලංකීය මධ්‍යස්ථානය ලෙස කටයුතු කරයි.

ඡායාරූප ශිල්පය කලා මාධ්‍යයක් ලෙස, සිංහල භාෂාවෙන් පොදු ජනතාව අතර ව්‍යාප්ත කිරීමේ භාර දූර කාර්යය සම්පූර්ණයෙන් නොමිලයේ සිදු කිරීම සංගමය පිහිටුවීමේ අරමුණ විය.දිවයිනේ ප්‍රාදේශීය ප්‍රජාවට අවශ්‍ය පහසුකම් සැලසුවේ එහි සාමාජිකයින්ට පමණක් නොව දිවයින පුරා පාසල්වල සිසුන්ටද නොමිලේ ඩිප්ලෝමා මට්ටම දක්වා පන්ති පවත්වමිනි. සීමිත වගකීම් සමාගමක් ලෙස ලියාපදිංචි ආයතනයක් වන අප සංගමය එහි සාමාන්‍ය සාමාජිකත්වයෙන් වාර්ෂිකව තේරී පත්වන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබේ.

සංගමය මගින් සිදු කරන සේවාවන් කිහිපයක් පහත දැක්වේ.

- ඡායාරූප ශිල්පය පිළිබඳව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් නොමිලයේ පවත්වාගෙන යාම හා වාර්ෂිකව විභාග පැවැත්වීම.
- ප්‍රයෝගික ඡායාරූප ගැනීමේ චාරිකා, වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම තුලින් ප්‍රවීනයන්ගේ දැනුම ආධුනිකයන්ට ලබා ගැනීමට අවස්ථාව උදාකර දීම.
- දේශිය හා ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන සංවිධානය කිරීම මගින් ඡායාරූප කලාවේ පෝෂණයටත්, යහපත් විචාර කලාවක් ඇතිවීමටත් ඉඩ සැලසීම.
- ඡායාරූප ශිල්පය පිළිබඳ '**ලංකා කැමරා**' සඟරාව ඇතුළු ප්‍රකාශන නිකුත් කිරීම.
- සංගමයෙන් පිරිනැමෙන **ඇසුරු සාමාජිකත්වය *(ANPAS)*, සහාගි සාමාජිකත්වය *(FNPAS)* සහ ගරු සහාගි සාමාජිකත්වය *(Hon.FNPAS)*** යන සම්මාන පිරිනැමීම.
- ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය මගින් පිරිනැමෙන ***AFIAP, EFIAP, ESFIAP, MFIAP*** සහ ***Hon.EFIAP*** සම්මාන ලබා ගැනීම සඳහා අවස්ථාව උදා කර ගැනීම.
- පාසල් සිසුන් සදහා ඡායාරූප ශිල්පය පළිබඳ ජාතික මට්ටමේ විභාගයක් පැවැත්වීම හා සහතික නිකුත් කිරීම

**70** වසරකට අධික කාලයක් ඡායාරූප ශිල්පය සඳහා මෙවන් උසස් සේවාවන් ලබා දෙන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන වෙනත් ආයතනයක් ශ්‍රී ලංකාව තුල නොමැත. අප සාමාජිකයන් ගේ කැපවීම මත පමණක් ම සාර්ථකත්වය කරා ගමන් කල ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මතු පරපුර වෙනුවෙන් ආරක්‍ෂා කර ගැනීම සැමගේ යුතුකම වන්නේය.

- මෙම පාඨමාලාව අවුරුදු 03 ක අර්ධකාලීන පාඨමාලාවකි.
- පාඨමාලාව නොමිලයේ පැවැත්වෙන අතර ප්‍රායෝගික සැසි සහ වෙනත් බාහිර කටයුතු සදහා වැය වන මුදල් තමා විසින් දැරිය යුතුවේ.
- සෑම ඉරිදා දිනකම පස්වරු 1.30 සිට 4.30 දක්වා කොළඹ දී හා කඩවත දී පැවැත්වේ. ඇතැම් අවස්ථාවන වලදී මාර්ගගත ආකාරය පංති පැවැත්වේ.
- සෑම වසරක් අවසානයේ දී ලිඛිත හා ප්‍රායෝගික විභාගයක් පැවැත්වෙන අතර, එම විභාගය සමත්වන සමාජිකයන් පමණක් ඊලග වසරේ පංති සඳහා ලියාපදිංචි කරණු ලබයි.

**Google පෝරමය පිරවීම සඳහා උපදෙස්**

- සියළුම අයදුම්පත් Google පෝරම ආකාරයට පමනක් ලබා ගැනීම සිදු කෙරේ.
- සාමාජික අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමනක් සම්පූර්ණ කරන්න.
- තරු සළකුණ යොදා ඇති ප්‍රශ්ණ සදහා අනිවාර්යෙන් පිළිතුරු සැපයිය යුතුයි.
- මෙම පෝරමය කොටස් 8 කින් සමන්විත වේ.

01. Nature of membership (සාමාජිකත්වයේ ස්භාවය)
    - මෙම කොටසේ දී සංගමයේ සාමාජිකත්වය පමනක්ද / පංති සහභාගිත්වය සමග සාමාජිකතවයද යනුවෙන් තේරීම සිදු කල යුතුවේ.
02. Personal information (පෞද්ගලික තොරතුරු)
    - 2.1 සිට 2.6 දක්වා සියළු ප්‍රශ්ණ සදහා අනිවාරයෙන් පිළිතුරු ලබා දිම සිදු කල යුතුවේ.
03. Personal Contact information (පෞද්ගලික සම්බන්ධිකරණ තොරතුරු)
    - 3.1 සිට 3.5 දක්වා ප්‍රශ්ණ ඇති අතර ඉන් 3.1, 3.2 හා 3.3 සදහා අනිවාරයෙන් පිළිතුරු ලබා දිම සිදු කල යුතුවේ.
04. Occupation & workplace details (රැකියාව හා සේවා ස්ථානයේ විස්තර)
    - 4.1 සිට 4.4 දක්වා ප්‍රශ්ණ ඇති අතර රැකියාව සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කල යුතුවේ.
05. Educational Qualifications (අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් )
    - 5.1 අනිවාර්ය වේ.
06. Other information (වෙනත් තොරතුරු)
    - 6.1 වෙනත් ඡායාරූප සංගම්වල සාමාජිකත්වය ලබා ඇත්නම් සදහන් කරන්න - අනිවාර්ය නොවේ
    - 6.2 වෘත්තීය සුදුසුකම් හා ලබා ඇති ජයග්‍රහණ - අනිවාර්ය නොවේ
    - 6.3 සුදු පසුබිමක් සහිත ඉදිරිය බලා සිටින පැහැදිලි උඩුකය ඡායාරූපයක් ( 3.5cm x 4.5cm) ඇතුලත් කලයුතුවේ - අනිවාර්යි.
07. Payment details (මුදල් ගෙවීම් තොරතුරු)

    (රුපියල් 750.00 මුදලක් ලංකා බැංකුව බම්බලපිටිය ශාඛාවේ ගිනුම අංක 717752වෙත බැරකරන්න. මෙම මුදල නැවත ගෙවනු නොලබයි.)
    - 7.1 බැංකුවට මුදල් ගෙවු රිසිට්පතෙහි ඡායාරූපයක් ඇතුලත් කිරීම - අනිවාර්යයි.
    - 7.2 මුදල් ගෙවූ බැංකුවේ නම - අනිවාර්යයි.
    - 7.3 බැංකුවට මුදල් ගෙවූ ආකාරය - අනිවාර්යයි.
    - 7.4 මුදල් ගෙවූ දිනය - අනිවාර්යයි.
    - 7.5 ගෙවු මුදල - - අනිවාර්යයි.
08. Certification (සහතික කිරීම)
    - 8.1 සහතික කිරීම - අනිවාර්යයි.
    - 8.2 Remarks - අනිවාර්ය නොවේ
    - 8.3 මෙම පොරමය ඉදිරිපත් කල දිනය - අනිවාර්යයි.

---

ඔබ විසින් යොමුකරණ ලද මාර්ගගත අයදුම්පත සලකා බැලීමෙන් පසු සම්මුඛ පරීක්ෂණයක් සදහා විද්‍යුත් තැපෑල මගින් දැනුම්දීම් සිදු කරණු ලැබේ. එයින් සමත්වන අයදුම්කරුවන් සදහා සාමාජිකතවය හා පාඨමාලාවට සදහා සම්බන්ධ විමට අවස්ථාව ලබාදෙනු ලබයි. **ඔබ විසින් ඇතුලත්විමේ ගාස්තුව වශයෙන් රුපියල් 5000.00 හා 2025,2026 හා 2027 වර්ෂ සදහා සාමාජික මුදල ලෙස රුපියල් 3000.00 ගෙවිය යුතුවේ. ගෙවිය යුතු මුලු මුදල රුපියල් 8000.00 ක් වේ. (සංගමයේ t shirt සෑම සාමාජිකයකු විසින් මුදල් ගෙවා ලබා ගත යුතු වේ)**

**සාලිය ලියනගේ**
අධ්‍යක්ෂ ලේඛකාධිකාරී (විභාග හා බඳවාගැනීම්)
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
071 396 3030